## දරුවන් උදෙසා බයිබලයක්



# නෝවා සහ මහත් ජලගැල්ම


**ඉදිරිපත් කරන්නා**: Edward Hughes

**නිදර්ශනය කරන්නා**: Byron Unger; Lazarus

**අදහසක් වඩා සරල ස්වරූපයකින් ප්‍රකාශ කරන්නා**

**සකස්කරන්නා**: M. Maillot; Tammy S.



60 - 3 **වන කථාන්තරය**

**www.M1914.org**

***Bible for Children,*** *PO Box 3, Winnipeg, MB R3C 2G1 Canada*



**අවසරය : මෙම කථාන්තරය උපුටා ගැනිමට හෝ මුද්‍රණය කිරීමට අවසර ඇතිමුත් එය විකිණීමට අවසර නැත.**


සිංහල

Sinhalese



**නෝවා දෙවියන් වහන්සේට නමස්කාර කළ මනුෂ්‍යයෙක්. අන් සියලු දෙනා දෙවියන් වහන්සේ ප්‍රතික්ෂේප කොට දෙවියන් වහන්සේට අකිකරු වුණා. එක් දවසක්, විශ්වාස කිරීමට පවා නොහැකි දෙයක් දෙවියන් වහන්සේ නෝවාට වදාළ සේක. එනම්, ''මම මේ නපුරු ලෝකය විනාශ කිරීමට යනවා, ඔබේ පවුල පමණක් ඉන් බේරේවි.''**





**දෙවියන් වහන්සේ නෝවාට අනතුරු අඟවමින් පැවසුවේ මහා ජලගැල්මක් විත් මුළු ලොවම වසාගන්නා බවයි. ඔබේ පවුලට හා බොහෝ සතුන්ට සිටීමට හැකි විශාල ලී නැවක් හදන්නැයි නෝවාට නියම කළ සේක. දෙවියන් වහන්සේ නෝවාට පැහැදිලි උපදෙස් ලබා දුන් සේක. නෝවා ද ඉතා කාර්ය බහුල විය.**


නෝවා නැවක් සාදන්නේ
ඇයිදැයි විස්තර කරදෙන
විට එය අසා සිටි මිනිසුන්
නෝවාට සමච්චල්
කළා. නමුත්
නෝවා
දිගටම
නැව සෑදුවා.
ඒ අතරතුර
දෙවියන් වහන්සේ
පිළිබඳව ජනතාවට පැවසුවා.
නමුත් කවුරුත් ඔහුට සවන්
දුන්නේ නැහැ.
3
නෝවාට ඉතා විශාල
ඇදහිල්ලක් තිබුණා. මීට පෙර
කිසි දිනක වත් දැක නොමැති
වුණත් නෝවා දෙවියන් වහන්සේ
විශ්වාස කළා. ඉක්මණින්ම
නැවට අවශ්‍ය සෑම දෙයක්ම
එහි තැන්පත් කළා.
4
ඉන්පසුව සතුන් නැව ඇතුළට දැම්මා. දෙවියන් වහන්සේ සමහර
සතුන් වර්ගවලින් සත් දෙනා බැගින් ද අනෙකුත් සතුන් අතරින්
දෙදෙනා බැගින් ද ඇතුළු කරන්නට අණ කළ සේක.
5
මහා විශාල සතුන් මෙන්ම කුඩා සතුන් ද විශාල පක්ෂීන්
මෙන්ම පුංචි කුරුල්ලන් ද නැවට අතුළු කළා.
6
නෝවා සතුන් නැවට තුළට රැගෙන එනවිට
මිනිසුන් නෝවාට අපහාස කරන්න
ඇති. ඔවුන් දෙවියන් වහන්සේට
විරුද්ධව පවු කිරීම නතර කළේ
නැහැ. ඔවුන්ට නැව තුළට
යාමට අවසර ඉල්ලුවේ
නැහැ.
7
අවසානයේ සෑම වර්ගයකම
සතුන් හා කුරුල්ලන් නැවට
ඇතුළු විය
''දැන් ඔබ ඔබේ
පවුලත් සමඟ
නැවට ඇතුළු
වන්න'' යැයි
දෙවියන් වහන්සේ
නෝවාට ආරාධනා කළ
සේක. නෝවා, ඔහුගේ භාර්යාව,
ඔහුගේ දරුවන් තිදෙනා සහ ඔවුන්ගේ
භාර්යාවන් නැවට ඇතුළු විය. එවිට
දෙවියන් වහන්සේ නැවේ දොර වැසූ සේක.
8


ඉන්පසු වැස්ස
පටන්ගත්තා. මහා ලොකු වර්ෂාවක් දින
හතළිහක් පුරා දවාලේත් රාත්‍රියේත් එක
දිගට පොළොව මත වැටුණා.
9


ජලගැල්ම සියලු නගර හා ගම්වලට
පැතිර ගියා. වැස්ස නතර වූ
පසුව කඳු පවා යටවී තිබුණා.
10


ජලගැල්ම ඉහළ යාමත් සමඟ නැව
කඳු මුදුනක නතර වුණා. සමහර
විට නැව ඇතුළත අන්ධකාරව හා
ගැස්සීම් සහිතව ඉතා භයානකව
පවතින්නට ඇති. ජලගැල්මෙන්
නොවා රැකගනු ලැබුවා.
11


මාස පහක ජලගැල්මෙන් පසු දෙවියන්
වහන්සේ විසින් වියළි සුළඟක් එවනු
ලැබුවා. නැව අරරත් කන්ද මත නතර
විය. ජලය බැස යනතෙක් තවත් දින
සතළිසක් නෝවාට නැව තුළ
සිටීමට සිදුවිය.
12


නෝවා නැවේ කවුළුවක්
හැර කපුටකු සහ පරවියකු
පිටතට යැවීය. එහෙත් පරවියාට
රැඳී සිටීමට පිරිසිදු වියළි තැනක්
නොතිබූ බැවින් නැවත හැරී
නැවට පියාඹා ආවේය.
13


සත් දවසකට පසු නැවතත්
පරවියා නැවෙන් පිටතට
හැරියේය. පරවියා ආපසු නෝවා
වෙතට ආවේ අමු ඔලීව දළුවක්
හොටෙන් රැගෙන ය. නොවා
තව සත් දවසක් බලා සිට පරවියා
පිටතට හැරියේය. ඌ නැවත හැරී
නාවේය. ජලය පොළව මතුපිටින් සිඳී
ගොස් තිබූ බව නෝවාට
තහවුරු විය.
14













නෝවා සහ මහත් ජලගැල්ම

දේව වචනයෙන් එක් කථාවක්

බයිබලයේ

උත්පත්ති 6-10

"ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ"
ගීතාවලිය 119:130

දෙවියන් වහන්සේ දන්නවා, අප වැරදි කර ඇති බව.
එම වැරදි උන් වහන්සේ පාපය ලෙස හඳුන්වන සේක.
පාපයේ කුලිය නම් මරණයයි.

උන් වහන්සේ ජීවමානව නැවත ස්වර්ගයට නැගුණු නිසා
අපගේ පාප උන් වහන්සේට කමා කළ හැක. ඔබට පාපයෙන්
මිදීමට අවශ්‍ය නම් දෙවියන් වහන්සේට කියන්න.

ආදර දෙව් පියාණෙනි, ජේසුස් වහන්සේ මා වෙනුවෙන් මැරී
නැවත නැගිටුණු බව මම විශ්වාස කරමි. මගේ ජීවිතයට පැමිණ
මගේ පව්වලට කමාව දුන මැනව. එවිට මට ඔබ වහන්සේ සමඟ
නව ජීවිතයක් ගත කළ හැක. සදාකාලයටම ඔබ සමඟ ඔබේ
දරුවකු ලෙස ජීවත්වීමට උදව් කළ මැනව. ආමෙන්.
ජොහන් 3:16

සැමදාම බයිබලය කියවමින් දෙවියන් වහන්සේට යාච්ඤා කරන්න.